# බුදුදහමෙහි පැවැත්මට තායි අවමංගල්‍ය චාරිත්‍රවල දායකත්වය

අපරැක්කේ සිරිසුධම්ම හිමි[1]

තායි සංස්කෘතියෙහි දිස්වන බහුතරයක් චාරිත්‍ර වාරිත්‍ර සඳහා ඍජු හෝ වක්‍ර ආභාසය ලැබී ඇත්තේ බුදුදහමෙනි. තායිලන්තයෙහි වෙසෙන බෞද්ධ ජනතාව ජීවිතයේ විශේෂ අවස්ථාවන් බොදු වතාවත් හා පන්සල මූලිකත්වයේ තබාගෙන සිදුකරයි. එහිදී ඔවුන් සිදුකරන චාරිත්‍ර වාරිත්‍රවල සුවිශේෂී අර්ථයන් ගම්‍යමාන වේ. මෙහිදී තායි වැසියන් විසින් සිදුකරනු ලබන අවමංගල්‍ය චාරිත්‍ර වාරිත්‍රවල විද්‍යමාන සංස්කෘතික හා සමාජ අර්ථයන් මෙන්ම වටිනාකම් පිළිබඳ අධ්‍යයනය කරනු ලබයි. මෙම පර්යේෂණය සහභාගීත්ව නිරීක්ෂණ යන ක්‍රමවේදයන් යටතේ සිදු කෙරේ. තායිලන්තය පුරා ඉතා මනහර වෙහෙර විහාරස්ථාන බහුලව දක්නට ලැබේ. ඒ ඒ විහාරස්ථානවල දායකත්වය දරන මිනිස්සු අවමංගල්‍යයක් වූ දවසේ පටන් අවසානය දක්වා සිදු කරන චාරිත්‍ර වාරිත්‍ර, සෙත් පිරිත් හා දාන ධර්මාදිය ඉතා ඕනෑකමින් පවත්වති. තායි වැසියන් පරම්පරානුගතව තත් චාරිත්‍රයන් ඉෂ්ට සිද්ධ කරනවා විය හැකිය. එහෙත් එමගින් පන්සල හා මිනිසුන් අතර ඇතිවන සැබැඳියාව බුදුදහමේ චිරස්ථිතියට මහගු දායකත්වයක් සපයයි. ශ්‍රී ලංකාව වැනි ථේරවාදී රටවල පවතින අවමංගල්‍ය චාරිත්‍රයන්ට වඩා තායි අවමංගල්‍ය චාරිත්‍රයන්වල වෙනස්කම් පවතී. ඒ අතරත ආදාහනාගාරය පන්සල තුළ පැවතීම, මෘත දේහය පංසලෙහි තැබීම, මියගිය පවුලෙහි ඥාතියෙක් හෝ ඊට වැඩි පිරිසක් අවම දින 07ක් හෝ ඊට වැඩි ගණනක් සසුන්ගත කිරීම, එම ශෝකී අවස්ථාවට වැළපීමෙන් තොරව අවබෝධයෙන් මුහුණදීම, අවසන් කටයුතු කරන තෙක් එම ගමෙහි හිමිවරු පිණ්පාතයෙහි නොවැඩීම, භික්ෂූන්ට මෙන්ම ගමේ මිනිසුන්ටද ආහාර පන්සලෙහිදී සම්පාදනය කිරීම, අවමංගල්‍යයක් අවසානයෙහි ගමේ රෝහලට හෝ පාසලට මුදල් ලබාදීම, අදාහනයෙන් පසු අළු ස්වල්පයක් පන්සලෙහි තැන්පත් කිරීම, විශේෂ දිනවලදී පන්සලට පැමිණ අළු තැන්පත් කළ ස්ථානයෙහි මලවුන් පිදීම වැනි කාරණාවන් ඒ අතර ප්‍රමුඛ වේ. සුජීවත්ව වාසය කරන්නවුන් එම චාරිත්‍ර වාරිත්‍ර ඔවුන් විසින් සිදු කළ යුතු වගකීමක් සේ සලකනු ලබයි. ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු කරන එම වගකීම්වල ගැබ්වන සමාජ, සංස්කෘතික අර්ථයන් බොහොමයකි. ඉහත සඳහන් සෑම චාරිත්‍රයක්ම මිනිසුන් පන්සල හා බුදුදහම වෙත සමීප කරවීමට දායකත්වයක් සපයන අතර චිරාත්කාලයත් බුදුදහම අවිච්ඡින්නව ආරක්ෂා වීමටද පිහිටාධාර වේ. විවිධ සමාජ හා සාමයික අභියෝගයන් සඳහා ඉතා සාමකාමීව සංස්කෘතික හා ආගමික සංරක්ෂණයන් තායි සංස්කෘතියෙහි අවමංගල්‍ය චාරිත්‍ර වාරිත්‍ර ඔස්සේ දැකගත හැකිය. දිනෙන් දින ලාංකේය මිනිසා පන්සලෙන් ඈත් වීම පිළිබඳ මැසිවිලි නගන ගිහිපැවිදි දෙපාර්ශ්වයට තායි බෞද්ධ සංස්කෘතියෙන් ගතහැකි දෑ බොහෝ බව ඉහත අනාවරණයන්ගෙන් ප්‍රතීයමාවන වේ.

**ප්‍රමුඛ පද** - බුදුදහම, අවමංගල්‍ය චාරිත්‍ර, තායිලන්තය, සබැඳියාව

---

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
sudhaaparekke@gmail.com